# *සමාජ විද්‍යා තරඟාවලිය - 2023*

**අකුරැස්ස අධ්‍යාපන කලාපය**

**පාසල් කාණ්ඩය :- 200අඩු/201-500/501-1000/1000 ට වැඩි**

**ශ්‍රේණිය :-10**

**කාලය :- පැය 02යි**

නම :-...............................................................

- **අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01).මහාවංශයේ ඇතුළත් තොරතුරු විවරණය කිරීම සඳහා ලියන ලද කෘතිය කුමක්ද?

1.සීහලට්ඨ කතා  2.වංසත්ථප්පකාසිනී

3.උත්තර විහාරට්ඨ කතා  4.විනයට්ඨ කතා

02).පෘථිවි තලයේ මතුපිට වර්ග ප්‍රමාණය කොපමණද?

1.ව.කි.මී. මිලියන 570  2.ව.කි.මී. මිලියන 120

3.ව.කි.මී. මිලියන 510  4.ව.කි.මී. මිලියන 610

03).ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රමයක් වන්නේ,

1.පළාත් පාලන මැතිතිවරණය  2.මහ මැතිවරණය

3.ජනමත විචාරණය  4.ප්‍රාදේශීය සභා මැතිවරණය

04).2023 වර්ෂයේදී ශ්‍රී ලංකාවට බල පෑ සුළි කුණාටුව වනුයේ,

1.බුරවි  2.මෝර්කා

3.නිවර්තන කුණාටු  4.නර්ගීස්

05).පොළොන්නරු යුගයේ භාවිතා කරන ලද කාසි වර්ගයක් වනුයේ,

1.කහාපණ කාසි  2.ලක්ෂ්මී කාසි

3.ඇතා සහ ස්වස්ති කාසි  4.තඹ මස්ස

06).සම්පූර්ණයෙන් ම ගොඩබිමින් වට වූ මුහුදු ඇතුළත් පිළිතුර වන්නේ,

1.එරල් මුහුද , කළු මුහුද  2.අරාබි මුහුද , චීන මුහුද

3.කැස්පියන් මුහුද , මධ්‍යධරණී මුහුද  4.කැස්පියන් මුහුද , එරල් මුහුද

07).හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් හමු වී ඇති ලෝහ මුද්‍රාවක් අයත් වෙළෙඳ සංවිධානය වනුයේ,

1.නානාදේසි  2.වලඤ්ජියාර්

3.අයින්නුර්වර්  4.කබොජ මහපුගිය

08).රාජ්‍යයක මූලිකාංගයක් වනුයේ,

1.ආණ්ඩුව 2.ව්‍යවස්ථාදායකය

3.පළාත් පාලන ආණ්ඩුව 4.විධායකය

09).ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) මූලස්ථානය පිහිටි නගරය,

1.කොළඹ 2.නව දිල්ලිය

3.වොෂින්ටන් 4.පැරිස්

10).දඹුලු විහාරයේ පිහිටුවා ඇති සෙල්ලිපියක නරේෂ්වර (නර ඉසෙර)යන සංකල්පයෙන් හඳුන්වනු ලැබූ රජතුමා කවුරුන්ද?

1.මහසෙන් රජු 2.නිශ්ශංකමල්ල රජු

3.කුටකණ්ණ අභය රජු 3.1 වන කාශ්‍යප රජු

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තිත් ඉර මත ලියන්න.**

11).ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වැසියන් වැව් පද්ධතියක් ....................................... යන නමින් හඳුන්වයි.

12).උන්නතාංශය සමඟ උෂ්ණත්වය ක්‍රමයෙන් පහළ යාම ........................................ නමින් හැඳින්වේ.

13). ස්විස්ටර්ලන්තයේ ප්‍රාදේශීය ආණ්ඩු ............................................. නමින් හඳුන්වයි.

14).පළමුවන විජයබාහු රජතුමා විසින් දළදා මැඳුරේ ආරක්ෂාවට ................................... හමුදාව යෙදවීය.

15).එක් සුවිශේෂී කරුණක් දැක්වීම සඳහා පමණක් නිර්මාණය කර ඇති සිතියම් .................................... වේ.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

16). භාතිකාභය රජතුමා විසින් රුවන්වැලි සෑය අලංකාර කිරීමට වීදුරු පබළු ගෙන්වීමට දූතයන් යවන ලද රට කුමක්ද?

17). ශ්‍රී ලංකාවට තේ වගාව හඳුන්වා දුන්නේ කවුරුන්ද?ඔහු කිනම් ජාතිකයෙක්ද?

18). ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා පිහිටුවා තිබෙන ආයතනය කුමක්ද?

19). දම්පියා අටුවා ගැටපදයේ සඳහන් පරිදි සූප ශාස්ත්‍රයේ නිපුණත්වයක් දැක් වූ කාන්තාවන් හැඳින් වූ නම කුමක්ද?

20). මෑතකදී රාජාභිෂේකය ලැබූ එංගලන්ත කුමරු කවුද?

- **අංක 21 සිට 25 දක්වා ඇති ප්‍රශ්නවලට ප්‍රශ්න පිළිතුරු සපයන්න.**

21).



1).මෙම රූපයෙන් නිරූපණය වන පුද්ගලයා නම් කරන්න.

2).මොහු කිනම් ජාතිකයෙක්ද?

22).



1).මෙහි දැක්වෙන පින්තූරයෙන් නිරූපණය වන ආගමික ස්ථානය කුමක්ද?

2).එම ආගමික ස්ථානය හා සම්බන්ධ කුමන ආගමික භක්තිකයන්ද?

23).



1).මෙම කඳු පන්තිය තුළ පිහිටි ලොව උසම කඳු ශිඛරය කුමක්ද?

2).මෙම කඳු පන්තියට උතුරු දෙසින් පිහිටි සානුව නම් කරන්න.

24).



1).මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

2).එය පිහිටි ස්ථානය කුමක්ද?



25).

1).මෙම බිතු සිතුවම අයත් යුගය කුමක්ද?

2).මෙම චිත්‍ර අධ්‍යනයෙන් හෙළි කර ගත හැකි තොරතුරු 2ක් ලියන්න.

- **ප්‍රශ්න අංක 26 සිටද 30 දක්වා ප්‍රශ්න වලට අ,ආ යනුවෙන් තීරු දෙකක් දැක්වේ.ඒවා සම්බන්ධතාව අනුව ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

26).

| අ | ආ |
|---|---|
| 1.ඉබන් බතුතා | A. චීන ජාතිකයෙකි. |
| 2. පාහියන් හිමි | B. අරාබි ජාතිකයෙකි. |
| 3. රොබට් නොක්ස් | C. ඉංග්‍රීසි ජාත්‍යිකයෙකි. |
| 4. රිබෙයිරෝ | D. පෘතුගීසී ජාතිකයෙකි. |

1). ACBD 2). BACD 3). ABCD 4). BCAD

27).

| අ | ආ |
|---|---|
| 1. යුරෝපයේ බිහි වූ ජාතික රාජ්‍යයකි. | A. ශ්‍රී ලංකාව |
| 2. බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක රටකි. | B. ස්විස්ටර්ලන්තය |
| 3. සන්ධීය ආණ්ඩු ක්‍රමයක් පවත්නා රටකි. | C. එංගලන්තය |
| 4. ඒකීය පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක රටකි. | D. චීනය |

1). ABCD 2). ACDB 3). CABD 4). CADB

28).

| අ | ආ |
|---|---|
| 1. නයිල් ගඟ | A. විලකින් |
| 2.තේම්ස් ගඟ | B. ග්ලැසියර් දිය වූ ජලයෙන් |
| 3. රයින් ගඟ | C. කඳුකර ප්‍රදේශයක උල්පතකි. |
| 4. මහවැලි ගඟ | D. උල්පතකින් |

1). ABCD 2). BDAC 3). ADBC 4). DABC

29). අ ආ

| අ | ආ |
|---|---|
| 1. පරිවර්තී ගෝලය | A. ඕසෝන් ස්ථරය පිහිටා ඇත. |
| 2. අපරිවර්තී ගෝලය | B. කාළගුණික සංසිද්ධි ඇති වේ |
| 3. මෙසෝ ගෝලය | C. උෂ්ණත්වය අධිකය. |
| 4. තාප ගෝලය | D. ජල වාෂ්ප,වළාකුළු නැත. |

1). BACD 2). BADC 3). DCBA 4). ABDC

30).

| අ | ආ |
|---|---|
| 1). ලම්බකර්ණ වංශයේ ආරම්භක පාලකයා | A. 2 වන පාරක්‍රමබාහු |
| 2). කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත උපාධිය ලද | B. මහසෙන් |
| 3). දඹදෙනි රාජධානියේ ආරම්භක පාලකයා | C. වසභ |
| 4). දේවත්වයෙන් පිදුම් ලද රජතුමා | D. 3 වන විජයබාහු |

1). CABD 2). DCAB 3). CADB 4). ABDC

- **ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

31).1). ශ්‍රී ලංකාව ජනාවාස කළ මානවයා කවුරුන්ද?

2). ගල් යුගයට අයත් මානවයා ජීවත් වූ පරිසර කලාප දෙකක් ලියන්න.

3). ගල් යුගයට අයත් මානවයාගේ අභිචාර විධි පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

32).1). ශ්‍රී ලංකා මෙට්‍රික් සිතියම් සූචකයට ඇතුළත් සිතියම් පත්‍ර ගණන කොපමණද?

2). 1:50 000 සිතියමක පරිමාණය දැක්වෙන ප්‍රධාන ක්‍රම දෙක ලියන්න.

3). වෙරළබඩ භූ දර්ශනයට අදාළ 1:50 000 සිතියමක දැකිය හැකි මානුෂ ක්‍රියාකාරකම් 3ක් ලියන්න.

33).1). අතීතයේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ක්‍රියාත්මක වූ යුරෝපීය රට කුමක්ද?

2). වජ්ජි ජනපදයේ ක්‍රියාත්මක වූ සප්ත අපරිහානි ධර්ම 2ක් ලියන්න.

3). වර්තමානයේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු 3ක් ලියන්න.

34).1). පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය කර ගත් ප්‍රථම පාලකයා නම් කරන්න.

2). එතුමා විසින් කරනු ලැබූ සේවාවන් දෙකක් ලියන්න.

3).පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට හේතු 2ක් ලියන්න.


35).1). ලෝකයේ සංකීර්ණ බහු සංස්කෘතික රටවල් 2ක් ලියන්න.

2). බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ 2ක් ලියන්න.

3). ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටක් බවට පත් වීමට හේතු වූ සංක්‍රමණ 3ක් ලියන්න.

- **36 සිට 45 දක්වා දී ඇති ස්ථාන සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ ලකුණු කරන්න.**

1. මල්වතු ඔය
2. කුරුණෑගල
3. ගෝකණ්ණ
4. මහනුවර
5. අගලවත්ත රබර් පර්යේෂණායතනය
6. දඹකොළ පටුන
7. මීගමුව
8. මිනිහාගල්කන්ද
9. තලවකැලේ තේ පර්යේෂණායතනය
10. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ


ශ්‍රී ලංකාව


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න